7 වන පිටෙන්

වාම දේශපාලන තලයේ මතය කැටි කර විධිමත් අන්දමින් ඉදිරිපත් කළ අවස්ථාවක් ලෙස සැලකිය හැක්කේ රෝහිත භාෂණ විසින් පසුගියදා රාවය පුවත්පතේ තබන ලද සටහනයි.

එයින් සාකච්ඡා කරන්නේ නීතිය හා යුක්තියුක්තභාවය අතර ඇති ගැටුමයි. එහි වඩා වැදගත් කොටසක් මෙසේ ය

**ඒ අනුව මුලින් ප්‍රේමකුමාර් ගුණරත්නම්ගේ පුරවැසිභාවය පිළිබඳ ප්‍රශ්නය සාකච්ඡාවට හා විවාදයට විවෘත දේශපාලන කරුණක් ලෙස පැවතුණි. අනතුරුව එය දේශපාලන කාරණාවක සිට නීතිමය කාරණාවක් බවට පෙරළීම මගින් ඒ විවාදය අත්හිටුවනු ලැබිණ. දැන් ලැබී ඇත්තේ නීතිමය තීන්දුවකි. එමගින් රජයේ දේශපාලන පිළිවෙත නීත්‍යානුකූල හා සුජාත එකක් බවට පෙරළා තිබේ. කලින් ඒ ගැන විරෝධය පෑම ආණ්ඩු පක් ෂයේ පිළිවෙත් විවේචනයක් සේ සැළකිණ. දැන් එය නීතියේ ආධිපත්‍යය අභියෝගයට ලක්කිරීම පිළිබඳ ගැටළුවකි. දේශපාලනය සහ නීතිය වෙන්කොට ඇඳගන්නා මනෝමය රේඛාව යහපාලන යථාර්ථයේ විස්මිත පිළිබිඹුවකැයි දැන් බොහෝ දෙනා සිතති.**

**නමුත් මේ පරිකල්පිත විස්මලන්තයෙන් එළියේ දේශපාලකයෝ නඩු අසති. නඩුකාරයෝ දේශපාලනය කරති. රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍ර හතරක් ඇතුළු විදෙස් ගමන් බලපත් පහක් භාවිතා කළ බවට චෝදනා එල්ල වූ හිටපු අමාත්‍ය විමල් වීරවංශට බල නොපාන ආගමන විගමන රෙගුලාසි උල්ලංඝණය පිළිබඳ චෝදනා කුමාර් ගුණරත්නම්ට බලපාන්නේ ඒ නිසා ය.** **දෙමටගොඩදී පුද්ගලයෙක් අයුතු ලෙස සිරකර තැබීමේ අදහසින් පැහැරගෙන යාමට කුමන්ත්‍රණය කිරීම, පැහැරගෙන යාමට අනුබල දීම, තුවාල සිදුකිරීම, සාපරාධී බිය ගැන්වීම්, අයුතු සිරකර තැබීම් හා සාපරාධී බලහත්කාරයී පිළිබඳ චෝදනා එල්ල වූ යහපාලන ආණ්ඩුවේ හවුල්කාර හිරුණිකා ප්‍රේමචන්ද්‍ර හමුවේ බල රහිත නීතිය ප්‍රේමකුමාර් ගුණරත්නම් හමුවේ බලවත් වන්නේ ද ඒ නිසාය. වීරවංශ සහ ප්‍රේමචන්ද්‍ර දෙතුන් පැයක් රඳවා තබා නිදහස ලබද්දී ගුණරත්නම්ට පහළොස් මාසයක් සිර දඬුවම් නියමවන්නේ ඒ අනුව ය.**

නීතිය සම්බන්ධයෙන් රෝහිත භාෂණගේ සංයුක්ත අදහස මෙසේ ය

**නීතිය ප්‍රචණ්ඩත්වයට විරුද්ධ බවත්, ප්‍රචණ්ඩත්වය පාලනය කරන්නට හැකියාවක් නීතියට ඇති බවත් සාමාන්‍ය පිළිගැනීමයි. නමුත් නීතිය මගින් ඇත්තෙන්ම කරන්නේ ප්‍රචණ්ඩත්වයේ එක් ස්වරූපයක් යුක්ති යුක්ත කොට ඊට නීතිමය වලංගුතාව ප්‍රදානය කිරීමයි. රාජ්‍ය ප්‍රචණ්ඩත්වය යනු ඒ වරප්‍රසාදිත ස්වරූපයයි. නීතියේ ආධිපත්‍යය යනු තෝරා බේරා වරණීය ලෙස ප්‍රචණ්ඩ බලය උපයෝග කරගැනීමට රජයට ඇති අනුත්තර අයිතිය සුජාත කොට චිරස්ථායී කිරීමයි. එක්කෝ අයිතීන් ප්‍රතික්ෂේප කිරීම හරහා ඒ ප්‍රචණ්ඩත්වය අභ්‍යාස කරන්නට ආණ්ඩුවකට පුළුවන. නැතහොත්, අයිතීන් ඉල්ලන්නා මර්දනය කිරීම මගින් ඒ ප්‍රචණ්ඩත්වය ක්‍රියාවට නංවන්නට ද ආණ්ඩුවකට පුළුවන.**

රෝහිත භාෂණගේ මෙම විග්‍රහය සමාජවාදී රාජ්‍යයක වුව නීතියට අදාළ ය. එහෙයින් එය රාජ්‍යයේ ගැටලූවක් මිස පවත්නා ක්‍රමයේ ගැටලූවක් නො වන බව පෙනේ.

මෙම අදහස සමාජවාදී අදහසක් නො වේ. මෙය වනාහි රාජ්‍යය ප්‍රතික්ෂේප කරන අරාජිකවාදී අදහසකි. නීතිය සම්බන්ධයෙන් මෙම අරාජිකවාදී අදහස රෝහිත භාෂණ වෙනත් කාරණා සම්බන්ධයෙන් දරන අදහස් සමග සමපාත වන්නේ කෙසේ ද යන්න ඔහු පැහැදිලි කළ යුතු ය.

අප සිතන අන්දමින් නම් ගතානුගතික මාක්ස්වාදී ආගමිකයන්ගේ මූලික ගැටලූව මෙයයි. රෝහිත භාෂණ කර තිබෙන්නේ එය වඩා භාෂාත්මක ලෙස නිරූවත් කිරීම පමණි.
ගතානුගතික මාක්ස්වාදී ආගමිකයා යනු අතිශය පරස්පර විරෝධී අදහස් පද්ධතියක සංකලනයකි.

මාක්ස්වාදියා ජාත්‍යන්තරවාදය දේශනා කරයි. ඒ ගමන් ජාතික රාජ්‍යය සිය දේශපාලන පදනම බවට පත් කර ගනියි. එක්කෝ පවත්නා ජාතික රාජ්‍ය රැක ගැනීම වෙනුවෙන් හෝ නැතිනම් අලූතින් ජාතික රාජ්‍ය හැදීම වෙනුවෙන් ඇපකැප වෙයි.

මාක්ස්වාදියා නිර්ධන පංතික ආඥාදායකත්වයක් යෝජනා කරයි. එහෙත්, ඇත්තෙන් ම එය වනාහි නිර්ධන පංතිය වෙනුවෙන් කටයුතු කරන බව කියන, බොහෝ විට මධ්‍යම පංතියෙන් සුසැදි, පෙරටුගාමීන් ලෙස තමා විසින් තමන් ම හඳුන්වා ගන්නා



**කුමාර් ගුනරත්නම් ලංකාවේ දේශපාලනය කරන්නට ඉල්ලා සිටින අවස්ථාව ලබා දිය යුතු ය. එවැනි ඉල්ලීම් සම්බන්ධයෙන් පොදු ප්‍රතිපත්තියකින් කටයුතු කරමින් එකිනෙක ප්‍රශ්න වෙන වෙන ම ගෙන දේශපාලනික විසඳුම් ලබා දිය යුතු ය. එහිදී ඇතැම් නීති නො තකා හරින්නට හෝ වෙනස් කරන්නට සිදු වේ. ඒ සම්බන්ධයෙන් අදාළ පාර්ශ්ව අතර දේශපාලන සම්මුතියක් ඇති කර ගත යුතු ය.**

බලවේගයක ආධිපත්‍යයකි. ප්‍රායෝගිකව ගත් කල ඉතා පැහැදිලි ආඥාදායකත්වයකි. එය තුළ ළපටි හෝ ප්‍රජාතාන්ත්‍රික කල්පනාවකට ඉඩක් නැත. එය පදනම් වන්නේ ද ආඥාදායක නීති පද්ධතියක් මත ය.
එහෙත්, මාක්ස්වාදීන් විසින් ධනේශ්වර යයි හඳුන්වනු ලබන රජයන් ඉදිරියේදී ඇතැම් විටෙක ඔවුහු අරාජිකවාදීහු ලෙස හැසිරෙති. කුමාර් ගුනරත්නම් ප්‍රශ්නය එවැනි අවස්ථාවකි.

එහෙත්, තමන්ට වාසිදායක අවස්ථාවලදී ඔවුන් නීතිය ගැන මෙම තර්කය නගන්නේ නැත.

මෙහි ඇති භයානක ම තත්වය නම්, ප්‍රතිගාමී අරමුණු වෙනුවෙන් ද අයෙකුට මෙම තර්කය ඉදිරිපත් කළ හැකි වීමයි. නිදසුනක් ලෙස ප්‍රගීත් එක්නැලිගොඩ ඝාතන නඩුව සම්බන්ධයෙන් ද මෙසේ කිව හැකි ය. මෙහිදී සිදු වී ඇත්තේ දේශපාලන කාරණාවක් නීතියට ලඝු කිරීමයි. ඞදේශපාලනය සහ නීතිය වෙන්කොට ඇඳගන්නා මනෝමය රේඛාව යහපාලන යථාර්ථයේ විස්මිත පිළිබිඹුවකැයි දැන් බොහෝ දෙනා සිතතිඞයි කියන විට එය මේ කාරණය හා අදාළ වන හැටිත් පැහැදිලි කිරීමේ හැකියාව රෝහිත භාෂණයට තිබිය යුතු ය.

මෙම තර්කය අතිශය භයානක ද වෙයි. නිර්ධන පංතික ආඥාදායකත්වයක් පිළිබඳ සංයුක්ත වැඩසටහනක් මේ මොහොතේ සීසීකඩ විසිර සිටින ලංකාවේ ගතානුගතික මාක්ස්වාදීන්ට නැති බව ඉතා පැහැදිලි ය. එහෙම තත්වයක් තිබියදී මෙවැනි තර්ක ඉදිරිපත් කිරීම අවසානයේදී වාසිදායක වන්නේ කාටද? විමල් වීරවංශට, හිරුනිකා ප්‍රේමචන්ද්‍රට නීතියෙන් ගැලවී සිටින්නට දී ඇති අවස්ථාව කුමාර් ගුනරත්නම්ටත් ලබා දෙන්නැයි ඉල්ලා සිටීම දේශපාලනික ද? එසේ නීතියෙන් ගැලවී ගැනීම අයිතිවාසිකමක් ලෙස තර්ක කළ හැකි ද?

මේ රටේ බොහෝ ප්‍රගතිශීලීහු විමල් වීරවංශ හා හිරුනිකා ප්‍රේමචන්ද්‍ර සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා උද්ඝෝෂණ කළ හ. නීතිය යම් මට්ටමකින් හෝ ක්‍රියාත්මක වුණේ එකී බලපෑම් නිසා ය.

නීතියේ ආධිපත්‍යය, ප්‍රජාතන්ත්‍රවාදය පමණක් නො ව, සමාජවාදය, ස්ත්‍රී*පුරුෂ සමානාත්මතාව වැනි සංකල්ප පවා පරමාදර්ශීය ඒවා ය. පරමාදර්ශයන් හැම විට ම යථාර්ථවාදී තත්වයන් නො වේ. එහෙත්, පරමාදර්ශයන් වෙනුවෙන් කරන අරගල යථාර්ථයට දැඩි බලපෑමක් කරයි.

සාධාරණත්වය හෝ සමාජවාදය හෝ පංති විරහිත සමාජය හෝ පිළිබඳ පරමාදර්ශයන් යථාර්ථයන් නො වුණත්, ඒ වෙනුවෙන් කර ඇති අරගල සමාජ සංවර්ධනයේ දිශානති තීරණය කිරීමට සෑහෙන්න බලපෑම් කළේ ය. එසේ නො වේ නම්, කම්කරු අයිතිවාසිකම්, මානව හිමිකම්, ළමා හිමිකම් ආදිය ගැන තැකීමක් කරන්නට ලාභය අරමුණු කර ගත් ධනපති පංතියට උවමනාවක් ඇති වන්නේ නැත.

නීති වනාහි අනුල්ලංඝනීය දෙයක් වන්නේ නැත. ඉතිහාසය පුරා ම මිනිසා නීති හැදීම ද, හදන නීති වෙනස් කිරීම ද කර තිබේ. ඇතැම් නීති වෙනස් කරනු ලබන්නේ ප්‍රචණ්ඩ ලෙස ය. එසේ කිරීම යුක්තියුක්ත වන තත්වයන් තේරුම් ගත හැකි වන්නේ එය සාධනීය ලෙස සමාජ සංවර්ධනයට ඉවහල් වන්නේ ද යන දේශපාලන විනිශ්චය මත ය. දේශපාලන විනිශ්චය එය පදනම් වන දෘෂ්ටිවාදයට සාපේක්ෂ කාරණයක් බව අමුතුවෙන් කියන්නට උවමනා නැත.

අයුක්තිය නීතිය බවට පත් වූ විට ප්‍රතිරෝධය වගකීමක් බවට පත් වේ යයි ඇමරිකා එක්සත් ජනපදයේ නිදහස් ප්‍රකාශනයේ කතුවරයකු වන තෝමස් ජෙෆර්සන් පැවසී ය. නීති උල්ලංඝන සාධාරකරණය වන්නේ එම නීති අයුක්ති සහගත වන තරමට ය.

**කුමාර් ගුනරත්නම් ලංකාවේ දේශපාලනය කරන්නට ඉල්ලා සිටින අවස්ථාව ලබා දිය යුතු ය. එවැනි ඉල්ලීම් සම්බන්ධයෙන් පොදු ප්‍රතිපත්තියකින් කටයුතු කරමින් එකිනෙක ප්‍රශ්න වෙන වෙන ම ගෙන දේශපාලනික විසඳුම් ලබා දිය යුතු ය. එහිදී ඇතැම් නීති නො තකා හරින්නට හෝ වෙනස් කරන්නට සිදු වේ. ඒ සම්බන්ධයෙන් අදාළ පාර්ශ්ව අතර දේශපාලන සම්මුතියක් ඇති කර ගත යුතු ය.**

වෙනත් ඕනෑම ප්‍රශ්නයක් සම්බන්ධයෙන් ද සිදු විය යුත්තේ එයයි. දෙමළ ජනතාවගේ දේශපාලන ඉල්ලීම සලකා බැලූවත් එසේ ය. සම්මුතියකට පැමිණීමට උත්සාහ නො කර යුද්ධයෙන් ප්‍රශ්නය විසඳා ගැනීමට උත්සාහ කිරීමෙන් සිදු වූයේ විනාශයකි. කුමාර් ගුනරත්නම් ප්‍රශ්නයට නම් යුදමය විසඳුමක් ඇත්තේ ම නැත.

## සන්නස Cartoon

